# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2089/55 - 2018 සැප්තැම්බර් මස 21 වැනි සිකුරාදා - 2018.09.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### වයඹ පළාතේ පළාත් සභාව

වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තියේ 13,15(1) සහ 15(2) වගන්ති සංශෝධනය

මෙහි පහත පළකරන වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්ති සංශෝධනය අද දින සිට දින තිහක් ඉකුත්වීමෙන් පසුව වයඹ පළාත් සභාවට ඉදිරිපත් කරන බව මෙයින් නිවේදනය කරමි. යම් අයෙකුට මෙම ප්‍රඥප්ති සංශෝධන විධිවිධාන පිළිබඳව ඉදිරිපත් කිරීමට යම් කරුණක් ඇතොත් එය එදිනට පෙර මාවෙත ඉදිරිපත් කළයුතු වේ.

ඩී. ජී. බී. එම්. ධර්මසිරි දසනායක,
ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන
සහ සංචාරක කටයුතු අමාත්‍ය.

ප්‍රධාන අමාත්‍යාංශය හා මුදල් හා ක්‍රම සම්පාදන,
ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, අධ්‍යාපන,
පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන,
පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවහන සහ
සංචාරක කටයුතු අමාත්‍යාංශය,
1 වෙනි මහල,
වයඹ පළාත් සභා කාර්යාල සංකීර්ණය,
කුරුණෑගල

වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන(ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තිය

වයඹ පළාතේ පළාත් සභාවේ 2013 අංක 01 දරන ප්‍රජා මූල සංවිධාන (ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක) ස්ථාපිත කිරීමේ හා විධිමත් කිරීමේ ප්‍රඥප්තියේ 13,15(1) සහ 15(2) යන වගන්ති සංශෝධනය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වන උපලේඛනයේ 1 වන (පළාත් සභා) ලැයිස්තුවේ 28 වන ව්‍යවස්ථාවට අනුකූලව ලැබී ඇති බලය අනුව වයඹ පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

| | |
|---|---|
| ප්‍රඥප්තියේ 13 වැනි වගන්තිය සංශෝධනය කිරීම | ප්‍රඥප්තියේ 13 වැනි වගන්තියේ අනු අංක 11 සහ 12 යටතේ පිළිවෙළින් දක්වා ඇති "වයඹ පළාත් මාර්ග දෙපාර්තමේන්තුවේ සහ මහා මාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරුන් යන ඡේදය සහ ජල සම්පාදන හා පාරිසරික සනීපාරක්ෂක ව්‍යාපෘති ක්‍රියාත්මක කරන පළාත් පාලන ආයතනවල ලේකම්වරුන්" යන ඡේදය ඉවත් කර පළාත් කමිටුවේ සංයුතිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| ප්‍රඥප්තියේ 15(1) වැනි වගන්තිය සංශෝධනය කිරීම | ප්‍රඥප්තියේ15(1) වගන්තියේ යෙදී ඇති "මාස දෙකකට වරක්" යන වචනය වෙනුවට "මාස හයකට (06) වරක්" යන වචනය සහ "අතිරේක රැස්වීම්" යන වචනය වෙනුවට "රැස්වීම් හා අතිරේක පුද්ගලයින්" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |
| ප්‍රඥප්තියේ 15(2) වැනි වගන්තිය සංශෝධනය කිරීම | ප්‍රඥප්තියේ15(2) වගන්තියේ යෙදී ඇති "දස දෙනෙක්" යන වචනය වෙනුවට "අට දෙනෙක් " යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.